// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2394/70 – 2024 ජූලි මස 26 වැනි සිකුරාදා – 2024.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උප වගන්තිය යටතේ සාදන රීති.

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19(5) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද ''2024 අංක 1 දරන බස්නාහිර පළාත් සභා අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධන) රීති'' මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී (ගෞරව),
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2024 ජූලි මස 18 වැනි දින,
බත්තරමුල්ල, බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේදී ය.

1A – PG 6791 – 09 (2024/ 07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**රීති**

1. මෙම රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2252/24 හා 2021 නොවැම්බර් මස 02 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ නිවේදනය කරන්නට යෙදී ඇති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීතින්ගෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2186/25 හා 2020 ජුලි මස 30 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ඇතුලත් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති සංශෝධනය කිරීම පිණිස පනවනු ලබයි.

2. මෙම රීති බස්නාහිර පළාත් අරමුදලට අදාල 2024 අංක 1 දරන බස්නාහිර පළාත් අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධන) රීති යනුවෙන් හැඳින්වේ.

3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2252/24 හා 2021 නොවැම්බර් මස 02 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයට ඇතුලත් බස්නාහිර පළාත් අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ සංශෝධිත රීතින්ගෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2186/25 හා 2020 ජුලි මස 30 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ නිවේදනය කරන්නට යෙදී ඇති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති 7 වන වගන්තියේ පළමු වන උප වගන්තිය යටතේ සඳහන් ''මිලියන පහළොවට'' යන වචන ඉවත්කර ''මිලියන පනහ'' යන වචන ඇතුලත් කරමින් මෙයින් සංශෝධනය කරනු ලබයි.

4. මෙම රීති යටතේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG 07 - 0268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.